(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(5).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2021 ජූලි 27 අඟහරුවාදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 91/2021

ගරු රනිල් වික්‍රමසිංහ මහතා,— 2021 ජූනි 22 ශ්‍රී ලංකා මුහුදු සීමාවේදී MV X – Press Pearl නෞකාව මුහුදුබත් වීම හේතුවෙන් ශ්‍රී ලංකා සාගර පාරිසරික කලාපයට හා සාගර ජීවීන්ට සිදු වූ හානිය, ජීවනෝපාය අහිමි වූ පුද්ගලයන් සහ ජාතික ආර්ථිකයට සිදු වූ බලපෑම පරීක්ෂා කර බලා සිය නිර්දේශ වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2021 ජූනි 22 දින කොළඹ වෙරළට ඔබ්බෙන් MV X–Press Pearl නෞකාව මුහුදුබත් වීම ශ්‍රී ලංකාවේ සිදු වූ දරුණුතම සාගර පාරිසරික ව්‍යසනය වන හෙයින්; සහ

මෙම ව්‍යසනය මඟින් සාගර සහ සත්ත්ව ජීවිත විනාශ කරමින් විශාල ආර්ථික හානියක් ද ඇති කර තිබෙන හෙයින් ද;

පහත සඳහන් කරුණු සලකා බැලීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි:—

(අ) MV X–Press Pearl නෞකාව මුහුදුබත් වීම හේතුවෙන් ඇති වූ ආර්ථික හානියේ ප්‍රමාණය ගණනය කිරීම;

(ආ) එමඟින් තම ජීවනෝපාය සම්බන්ධයෙන් බලපෑම් ඇති වූ පුද්ගලයන් සංඛ්‍යාව ඇස්තමේන්තු කිරීම;

(ඇ) එලෙස පීඩාවට පත් වූ ජනතාවට ලබා දීම සඳහා මූල්‍යමය සහන සහ අනෙකුත් වන්දි නිර්දේශ කිරීම; සහ

(ඈ) මෙම ව්‍යසනය හේතුවෙන් හානියට ලක් වූ (i) සාගර හා සත්ත්ව ජීවිත සහ (ii) සාගර පතුලේ පරිසර ප්‍රමාණය ගණනය කිරීම.

2\. (අ) සභාපතිවරයා සහ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන් කථානායකවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය; සහ

(ආ) කාරක සභාව විසින් තම පළමු රැස්වීමේ දින සිට මාස හයක (6) කාලයක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් කාලය දීර්ඝ කර තිබෙන්නේ නම්, එම නියම කරන ලද දිනය දක්වා වූ කාලය තුළ පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු ය.

3. එකී කාරක සභාවට,—

(අ) තම ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීමට අවශ්‍ය වන බව කාරක සභාවට හැඟී යන්නේ නම්, එවැනි ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීම සඳහා පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට ද;

(ඇ) කාරක සභාවට සහාය වීම පිණිස විශේෂඥ සහ විද්වතුන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඈ) වරින් වර අතුරු වාර්තා සකස් කිරීමටත් පාර්ලිමේන්තුව කල් තබා ඇත්තේ වුවද රැස්වීම් පැවැත්වීමට ද

බලය තිබිය යුතු ය.